දුරකථන / தொலைபேசி / Telephones } 011-2136600 / 011-2136650

ලේකම් / செயலாளர் / Secretary } 011-2136602

ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2876169 / 011-2876181

විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail } info@psc.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Website } www.psc.gov.lk


මගේ අංකය / எனது இல. / My No. } PSC/DIS/01/02/2022-02

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022.04.25


රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**


---

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත මූලික විමර්ශන වාර්තා හා චෝදනා පත්‍ර කෙටුම්පත් ඉදිරිපත් කිරීම</u>**

යම් සිද්ධියක් සම්බන්ධයෙන් සිදුකරන ලද මූලික විමර්ශනයක වාර්තාව හා ඊට අදාළ චෝදනා කෙටුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමේදී යම් යම් අඩුපාඩු සහිතව ඉදිරිපත් කිරීම හා නැවත එම අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා ගතවන කාලය සම්බන්ධයෙන් ද අවධානය යොමු කර මූලික විමර්ශනයක වාර්තා හා චෝදනා කෙටුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු ඇතුලත් කර පිරික්සුම් පතක් (Check list) සකස් කර ඇත.

02. එම පිරික්සුම්පත මේ සමග ඔබ වෙත යොමු කරන අතර ඉදිරියේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත මූලික විමර්ශන වාර්තා හා චෝදනා පත්‍ර කෙටුම්පත් ඉදිරිපත් කිරීමේදී එම පිරික්සුම් පතට අනුව පරීක්ෂා කර බලා, සලකුණු කරන ලද පිරික්සුම් පතේ පිටපතක් ද සහිතව අදාළ ලේඛන රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

එම්.ජේ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත මූලික විමර්ශන වාර්තා ඉදිරිපත් කිරීමේදී

සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ පිරික්සුම් පත

| අනු අංක | විස්තරය | ඔව්/නැත | අදාළ නොවේ |
|---|---|---|---|
| 01 | මූලික විමර්ශනය සඳහා නිලධරයෙකු/ නිලධර කමිටුව විධිමත්ව පත් කර ඇත. (ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 13:1 වගන්තිය අනුව) | | |
| 02 | මූලික විමර්ශන නිලධරයා/මූලික විමර්ශන කමිටුව විධිමත්ව පත් කිරීමේ ලිපියේ සහතික කළ පිටපතක් මූලික විමර්ශන වාර්තාව සමග ඉදිරිපත් කර ඇත. | | |
| 03 | මූලික විමර්ශන වාර්තා ප්‍රමාදවී ඇත් නම් ඊට හේතු ඉදිරිපත් කර ඇත. (රා.ප.ච. 30/2019 න් සංශෝධිත ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 13:2 වගන්තිය පිළිබඳ අවධානය යොමුකර තිබීම) | | |
| 04 | මූලික විමර්ශන වාර්තාවේ යොමු අංකය හා දිනය පැහැදිලිව සඳහන් කර ඇත. | | |
| 05 | මූලික විමර්ශනයේදී සිදුවීමට/ සිදුවීම්වලට අදාළ නිලධරයන්ගෙන්/ පුද්ගලයන්ගෙන් ප්‍රකාශ ලබා ගෙන ඉදිරිපත් කර ඇත. | | |
| 06 | මූලික විමර්ශනයේදී සැකයට පාත්‍ර වූ නිලධරයා හෝ නිලධරයන්ගෙන් ප්‍රකාශ ලබා ගෙන ඉදිරිපත් කර ඇත. | | |
| 07 | එල්ලවී ඇති චෝදනා, භාණ්ඩ ඌනතාවයක් හෝ භාණ්ඩ පරිහරණයක් සම්බන්ධයෙන් වන කල්හි, අදාළ නිලධරයා/ නිලධරයන් භාරයේ ඇති ඊට අදාළ සියලුම භාණ්ඩ තොග ගණන් ගැනීමකට භාජනය කර ඇත. (ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 13:6 වගන්තිය අනුව) | | |
| 08 | යම් ගණනය කිරීමක් මගින් ලබා ගන්නා ලද මුදල් හෝ භාණ්ඩ ප්‍රමාණයක් හෝ චෝදනා වලට අන්තර්ගත කරන්නේ නම් එම ගණනය කිරීම පැහැදිලිව මූලික විමර්ශන වාර්තාව මගින් ඉදිරිපත් කර ඇත. | | |
| 09 | මූලික විමර්ශනයකදී කිසියම් නිලධරයෙකු සාක්ෂි ලබාදීම ප්‍රතික්ෂේප කිරීම ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 13:10 වගන්තිය අනුව වාර්තා කර ඇත. | | |
| 10 | මූලික විමර්ශනයට අදාළ සිද්ධිය සම්බන්ධ සාරාංශයක් මූලික විමර්ශන වාර්තාවට ඇතුළත් කර ඇත. | | |
| 11 | මූලික විමර්ශන නිලධරයා/ කමිටුව විසින් අදාළ පාර්ශවයන් වෙතින් ලබා ගත් ප්‍රකාශ හා ඔහු තම භාරයට ගත් ලිපි ලේඛන ආදිය විමර්ශන වාර්තාව සමග නිසි පරිදි ඇමුණුම් කර ඉදිරිපත් කර ඇත. (ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 13:12 වගන්තිය අනුව) | | |
| 12 | එම ලේඛන පිළිවෙලට අංක කර කොඩිකර ඉදිරිපත් කර ඇත. | | |
| 13 | ලේඛන ඉදිරිපත් කිරීමේදී එම ලේඛනයන්ගේ මුල් පිටපත් හෝ මුල් පිටපත්වලින් ලබා ගන්නා ලද මාණ්ඩලික නිලධරයෙකු විසින් සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කර ඇත. | | |
| 14 | රජයේ ඉඩම් පිළිබඳ ගැටලුවලට අදාළ මූලික විමර්ශනයන් සිදු කිරීමේදී එම ගැටලුවට අදාළ දීමනා පත්‍ර, බලපත්‍ර, පත්ඉරු, දෙපාර්තමේන්තු චක්‍රලේඛ, පනත් සහ වෙනත් අදාළ ලේඛනයන්හි සහතික කරන ලද පිටපත් මූලික විමර්ශන වාර්තාව සමග ඉදිරිපත් කර ඇත. | | |

| | | | |
|---|---|---|---|
| 15 | චෝදනා පත්‍ර කෙටුම්පත අදාළ වන පරිදි ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 5 පරිශිෂ්ටය හෝ 6 පරිශිෂ්ටය හෝ අනුව සකස්කර ඇත. | | |
| 16 | කෙටුම්පත් චෝදනාවල චූදිත විසින් සිදු කරන ලද වරද හා වරද සිදු කරන ලද දිනය/ කාල පරිච්ඡේදය නිශ්චිතව සඳහන් කර ඇත. | | |
| 17 | ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ 15 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සම්බන්ධයෙන් චෝදනා කෙටුම්පත් කිරීමේදී උල්ලංඝනය කරන ලද ආයතන සංග්‍රහයේ විධිවිධානය, මුදල් රෙගුලාසිය, චක්‍රලේඛවල වගන්තිය, දෙපාර්තමේන්තු අත්පොත්වල, ලිඛිත උපදෙස්වල සහ උපදෙස් සංග්‍රහවල විධිවිධාන නිශ්චිතව සඳහන් කර ඇත. | | |
| 18 | චෝදනා පත්‍ර කෙටුම්පතට සාක්ෂිකරුවන් හා ලිපිලේඛන ඇතුළත් කිරීමේදී කෙටුම්පත් කරන ලද චෝදනා සනාථ කිරීමට අවශ්‍ය වන සාක්ෂිකරුවන් හා සාක්ෂි ඇතුලත් නිශ්චිත ලේඛන චෝදනා පත්‍ර කෙටුම්පතට ඇතුළත් කර ඇත. | | |
| 19 | චෝදනා සනාථ කිරීම සඳහා විශේෂඥ මත අවශ්‍ය වන අවස්ථා වලදී ඒවා ලබා ගෙන ඉදිරිපත් කර ඇත. | | |
| 20 | චෝදනා පත්‍ර කෙටුම්පත නිවැරදිව හා ක්‍රමවත්ව සකස්කර ඇති බවට මාණ්ඩලික නිලධරයෙකු විසින් සහතික කර ඇත. | | |
| 21 | චෝදනා පත්‍ර කෙටුම්පතේ මෘදු පිටපත (soft copy) ඉදිරිපත් කර ඇත. | | |
| 22 | මූලික විමර්ශන වාර්තාව සමග චෝදනා පත්‍ර කෙටුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමේදී අදාළ නිලධරයා/ නිලධරයන් සම්බන්ධව ඉදිරි විනය පියවර ගැනිමට අදාළව මූලික විර්ශනයේ නිරීක්ෂණ හා නිර්දේශ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා, අමාත්‍යාංශ ලේකම් හා පරිපාලන බලධාරියා විසින් නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කර ඇත. | | |
| 23 | සැකයට පාත්‍රවූ නිලධරයා හෝ නිලධාරයන්ගේ වර්තමාන සේවය/ ශ්‍රේණිය/ තනතුර හා සේවා ස්ථානය වෙනස් වී ඇත්නම් ඒ පිළිබඳව දන්වා එවා ඇත. | | |
| 24 | යම් මූලික විමර්ශනයකින් විෂමාචාර සිදුකරන ලද නිලධරයන් කිපදෙනෙක් සම්බන්ධයෙන් තොරතුරු හෙළිවී ඇති අවස්ථාවකදී, ඔවුන් සියලුදෙනා සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව වාර්තා කර ඇත. (ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 11:3 වගන්තිය අනුව) | | |

<u>සටහන</u>

මූලික විමර්ශනයට අදාළව අත් අකුරින් ප්‍රකාශ සටහන් කර ගැනීමේදී එම ප්‍රකාශ පැහැදිළිව සටහන් කිරීමටත් හැකි සෑම අවස්ථාවකදීම යතුරු ලියනය කර ඉදිරිපත් කිරීමටත් කටයුතු කරන්නේ නම් මැනවි.